**ශීර්ෂය 279 - කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

-----------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 18 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරනය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1** **මූල්‍ය නොවන වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණ** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ස්ථාවර වත්කම් ප්‍රකාශයේ ශේෂයන් හා භාණ්ඩාගාර SA 82 ආකෘතියේ ආරම්භක ශේෂය රු.3,067,517 කින් ද මිලදී ගැනීම් යටතේ රු.3,550,242 කින් ද, අපහරණයන් යටතේ රු.482,727 කින් ද වෙනසක් නිරීක්ෂණය විය. | 2022.02.28 හා 2021.02.21 දිනැතිව SA 82 ආකෘති දෙකක් පැවති අතර 2021.02.11 දිනැති SA 82 ආකෘතිය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට යොදාගෙන ඇත. | භාණ්ඩාගාර සටහන් හා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සැසඳීම් කර නිවැරදි වටිනාකම් දැක්වීමට කටයුතු කල යුතුය. |
| (ආ) ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීමට අදාල වැය විෂයේ එකතුව රු.73,336,169 ක් වුවත්, භාණ්ඩාගාර SA 82 ආකෘතියේ රු.97,002,938 ක් වූයෙන් රු.100,553,180 ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනස්කම් සඳහා හේතු හා පැහැදිළි කිරීම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්කර ඇත. | - එම - |

## 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු රු.925,954,938 ක මූලධන වියදම, මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන වලදී නිවැරදි කරමි. | නියමිත වර්ගීකරණයන් මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |
| (ආ) සහනාධාර හා මාරුකිරීම් යටතේ දැක්විය යුතු දේපල ණය පොලී වියදම වූ රු.7,179,866 පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් යටතේ දක්වා තිබුණි. | - එම - | - එම - |

## 1.6.3 අග්‍රිම ගිණුම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තු පොත් අනුව අග්‍රිම ලැබීම් හා ගෙවීම් රු.5,384,340,247 ක් වුවද භාණ්ඩාගාර පොත් අනුව රු.5,449,700,247 වූයෙන් රු.65,360,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | භාණ්ඩාගාර පොත්වල සිදුව ඇති දෝෂයකි. | භාණ්ඩාගාර සටහන් සමඟ සැසඳීම් කර නිවැරදි අගය දැක්විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 279 ශීර්ෂයට හා අනෙකුත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 3,459 ක් හා රු.මිලියන 6,219 ක් වශයෙන් රු.මිලියන 9,678 ක අග්‍රිමයක් ඉල්ලුම් කළද ලැබී තිබුණේ රු. මිලියන 4,878 ක් පමණි. | අවශ්‍ය ප්‍රමාණයට අග්‍රිම ලබා දීමට භාණ්ඩාගාරයට නොහැකි වී ඇත. | භාණ්ඩාගාරය සමඟ සමීප සම්බන්ධතාවයකින් යුතුව අග්‍රිම කළමනාකරණය කර ගැනීමට කටයුතු කල යුතුය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ඉටුකර තිබූ ව්‍යාපෘති සඳහා රු.257,846,790 ක බැරකම්වලට සමාලෝචිත වර්ෂයේදී එළඹී තිබුණි. | ප්‍රතිපාදන ලැබෙන ප්‍රමාණය අනුව අතැති බිල්පත් නිරවුල් කිරීමට කටයුතු කරමි. | ලබාදී ඇති ප්‍රතිපාදන හා අග්‍රිම සීමාවන් තුල වැඩ විෂයයන් හඳුනාගෙන ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.3 තැන්පතු ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 2 ඉක්ම වූ කොන්ත්‍රාත් රැඳවුම් තැන්පතු ශේෂය රු.5,166,140 ක් වූ අතර, එයින් රු.3,815,209 ක් වසර 5 ක් ඉක්මවූ ශේෂයන් විය. | 2022 අප්‍රේල් 30 දින වන විට රු. 1,046,617 ක් නිරවුල් කර ඇති අතර ඉතිරිය නොපමාව නිරවුල් කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි අනුව තැන්පත් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | තාවකාලිකව රඳවාගන්නා තැන්පතු ශේෂය තුල වර්ෂ 2 ඉක්මවූ රු.365,018 ක තැන්පතු ශේෂයක් පැවතුණි. අදාල කාර්යය ඉටු නොකිරීම හෝ කාර්යය ඉටුකිරීමෙන් පසු ඉතිරිය අදාල පාර්ශව වෙත නොයැවීම මත වර්ෂ 1 ත් 2 ත් අතර රු.3,877,253 ක තැන්පතු ශේෂයක් වූ අතර, මින් රු.2,029,574 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා රු.1,534,511 ක් දැරණියගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව විය. | 2022 අප්‍රේල් 30 දින වන විට රු. 1,951,333 ක් නිරවුල් කර ඇති අතර ඉතිරිය නොපමාව නිරවුල් කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කර තැන්පත් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලියේදී සම්බන්ධිත ආයතනයන් සමඟ කටයුතු කිරීමේදී සිදුවන ප්‍රමාදයන් හේතුවෙන් වන්දි ගෙවීම් රු.156,400,553 ක තැන්පතු ශේෂය තුල වර්ෂ 1 ත් 2 ත් අතර රු.65,416,687 ක්, වර්ෂ 2 ත් 5 ත් අතර රු. 19,800,498 ක් හා වර්ෂ 5 ට වැඩි රු.31,907,431 ක් පැවතුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා සම්බන්ධිත ආයතනයන් සමඟ කටයුතු කිරීමට සිදුවන බැවින් ඒ සඳහා කාලයක් ගත වන බව දන්වමි. | අදාල ආයතන සමඟ පසු විපරම් කටයුතු සිදුකර ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදුකරවා ගැනීමට කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයට අදාලව අංශ හා සේවාවන් 23 ක් ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, එකී ක්‍රියාකාරී සැලැස්මෙහි සැලසුම් කරන ලද කාර්යයන්හි ප්‍රගතිය හඳුනාගත හැකි වන පරිදි අදාල සැලැස්මට අනුකූල වන ලෙස ප්‍රගති වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට අදාළ තොරතුරු ඇතුළත්ව ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කරමි. | වාර්ෂික සැලසුම හා ප්‍රගති වාර්තා සමරූපී ලෙස පිළියෙල කල යුතුය. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ 2019 වර්ෂයේදී අරණායක ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ රු.3,211,954 ක් වැයකර ඉදිකර තිබූ ගොඩනැගිල්ලද, 2018 වර්ෂයේ රු.1,005,930 ක් වැයකර මිලදී ගෙන තිබූ යන්ත්‍ර උපකරණද සමඟ, ඇපලාවවත්ත කම්හල් ගොඩනැගිල්ල 2020 මාර්තු 02 දින ඇපලාවවත්ත එකමුතු ග්‍රාම ශක්ති ජනතා සමිතිය වෙත කම්හලක් පවත්වා ගෙන යාමට භාරදී තිබුණි. ප්‍රධාන යන්ත්‍රය මගින් යකඩ තුනී කිරීමද , සෙසු යන්ත්‍ර මගින් නිමැවුමට අදාල අනෙකුත් කාර්යන්ද සිදුවන මෙම කර්මාන්ත ශාලාවේ වර්තමානය වනවිට ගම්මානයේ කම්හල්කරුවන් සංඛ්‍යාව අඩුවීම, තුනීකල යකඩ සඳහා ඉල්ලුම අඩුවීම වැනි හේතු නිසා යන්ත්‍ර ධාරිතාවයට සාපේක්ෂ නිමැයුමක් ලබා නොගන්නා තත්වයක පැවතුණි. රැස්කල ආදායම් හා වියදම් සහ කම්මල මඟින් සිදුකල කාර්යයන් පිළිබඳ ලේඛන නඩත්තු කර නොතිබීම හේතුවෙන් උපයන ආදායම හා වියදම පිළිබඳව සහ කම්මල මඟින් සිදුකල කාර්යයන් පිළිබඳ | ප්‍රමාණවත් ධාරිතාවයකින් කම්හල පවත්වාගෙන යාමට හා අදාළ වාර්තා නිසි ලෙස පවත්වාගෙන යාමට ග්‍රාමශක්ති ජනතා සමිතියට හා නිලධාරීන්ට උපදෙස් දී ඇත. | නිරන්තර ආසන්න අධීක්ෂණයක් සිදුකරමින් අරමුණුගත කාර්යයන් සඳහා කාර්යක්ෂමව යෙදවීමට කටයුතු කල යුතුය . |

තොරතුරු ඉදිරිපත් නොවුණි. එමෙන්ම කම්මල පවත්වාගෙනයාම සම්බන්ධයෙන් මග පෙන්වීමක් හෝ උපදෙස් ලබාදීමක් සහ ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදුවන බවක්ද තහවුරු නොවුණි.

### 3.3 නොවිසඳී ඇති විගණන ඡේද

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව ඉකුත් වර්ෂවල විගණකාධිපති වාර්තාවල ඇතුලත් කර තිබූ පසු විපරම් කටයුතු නිමනොවූ විගණන ඡේද පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ ජනතා සමිති ස්ථාපිත කිරීම සඳහා 2018 සහ 2019 වර්ෂවලදී ලද ප්‍රතිපාදන මත පළමු අදියර යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 තුල ජනතා සමිති 43 ක් වෙත රු.69,575,200 ක් ද 2019 වර්ෂයේදී දෙවන අදියර යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 තුල ජනතා සමිති 96 ක් වෙත රු.4,560,000ක් ද ලබාදී තිබුණි. එහෙත් 2020 වර්ෂය අවසානය වනවිට පළමු අදියරේදී ලබාදුන් මුදලින් සියයට 71 ක් ලෙස සමිති 34 ක රු.49,812,357 ක් ද, දෙවන අදියරේදී ලබාදුන් මුදලින් සියයට 96 ක් ලෙස සමිති 96 ක රු.4,358,021 ක් ද අදාල කාර්යය සඳහා යෙදවීමෙන් තොරව බැංකු ගිණුම්වල නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි. | ඉතිරිව පවතින මුදල වඩාත් ඵලදායීව ප්‍රජා සංවර්ධන කටයුතු සඳහා යොදවා ගැනීමට කටයුතු කර ඇත. | අදාල ව්‍යාපෘති සක්‍රීය කිරීම හා අරමුදල් අරමුණුගත කාර්යයන් සඳහා භාවිතා කල යුතුය. |
| (ආ) | කෑගල්ල, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2009 සිට 2013 කාල පරිච්ඡේදය තුල සිදුව තිබූ විශ්‍රාම වැටුප් වංචාවෙන් තවදුරටත් රු.16,765,760 ක මුදලක් අයකරගැනීමට පැවතුණි. | අධිකරණ කටයුතු සිදු කෙරෙමින් පවතින බව. | ආයතන සංග්‍රහයේ විධි විධාන අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ රු.48,942,000 ක ඇස්තමේන්තුවක් මත 2014 ඔක්තෝබර් මස වැඩ ආරම්භ කර තිබූ වරකාපොල බස් නැවතුම්පොළ හා සාප්පු සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ඉදිකිරීම් භූමියේ හිමිකාරීත්වය පිළිබඳ ගැටළු මත 2015 අගෝස්තු 31 දින ලද අධිකරණ වාරණ නියෝගයක් හේතුවෙන් රු.15,189,389 ක කළ වැඩ වටිනාකමකින් අනතුරුව ව්‍යාපෘතියේ ඉදිකිරීම් නතර කර තිබුණි. | අධිකරණ කටයුතු තවමත් අවසන් වී නොමැත. | වැයවන මුදලට ප්‍රතිලාභ ලැබෙන පරිදි ව්‍යාපෘති සැලසුම් කල යුතුය. |

**3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෑගල්ල දිස්ත්‍රික්කයේ 2016 සිට 2019 වර්ෂයන්හි ඇති වූ නාය යෑමෙන් හා නාය යෑමේ අවදානම් තත්වය හේතුවෙන් විපතට පත්වූ පවුල් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ එක් පවුල් ඒකකයක් වෙනුවෙන් පෞද්ගලික ඉඩමක නැවත පදිංචි වීමේදී රු.1,600,000 ක්ද රජයේ ඉඩමක පදිංචි වීමේදී රු.1,200,000 ක්ද බැගින් වූ වන්දි මුදල් ගෙවීමට අනුමත වී පැවතුණි. එහෙත් නිවාසලාභීන් විසින් තම නිවාස ප්‍රමිතියට ඉදිකර නොතිබීම , වැඩ අවසන් නොකිරීම වැනි හේතු මත ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 කට අදාලව වන්දිලාභීන් 190 දෙනෙකු වෙත ගෙවිය යුතුව පැවති වන්දි මුදල රු.76,278,000 ක් විය. | මෙතෙක් ලබාදුන් මුදල් සඳහා නිවාස ඉදිකිරීම් කටයුතු ප්‍රමාණවත් පරිදි අවසන් කර නොමැති නිවාසලාභීන් වෙත ආධාර ගෙවීම අත්හිටුවා ඇති බව. | නිරන්තර පසු විපරම් කර නිවාසලාභීන් නිවාස ඉදිකිරීම සඳහා උනන්දු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කෑගල්ල දිස්ත්‍රික් ලේකම්ගේ අංක SDK/EST/ADM/SOSER/D15/01/11 හා 2018 ජුනි 14 දිනැති ලිපිය අනුව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ආබාධ සහිත වූවන්ගේ ස්වශක්ති සංවිධානය හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ඒකාබද්ධ වැඩසටහනක් වශයෙන් අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයන් 300 ක් සඳහා නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමටත්, මේ යටතේ නව නිවසක් සඳහා රු.ලක්ෂ 5 ක උපරිමය බැගින්ද , අර්ධ නිවාස සඳහා රු. ලක්ෂ 2 ක උපරිමය බැගින්ද, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ආධාර ලබාදීමටත් සැලසුම් කර තිබුණි. නිවාස ප්‍රතිලාභීන් 381 දෙනා වෙත 2020 ජුනි 21 දින දක්වා ගෙවා ඇති මුදල රු.23,710,000 ක් පමණක් වූ අතර, තවදුරටත් ගෙවීමට ඇති ආධාර මුදල රු.95,690,000 ක් විය. 2018 පෙබරවාරි මාසයේදී කොඩි අලෙවි කිරීමේ වැඩසටහනක් සිදුකර එමඟින් රු.7,362,647 ක් රැස් කර එය ආබාධ සහිත තැනැත්තන්ගේ දිස්ත්‍රික් ස්වශක්ති බල මණ්ඩලයේ (ස්වශක්ති අරමුදල) බැර කර තිබුණද ඒම මුදල්ද 2022 අප්‍රේල් 30 දක්වාම අදාළ කාර්යයන් සඳහා භාවිතා කර නොතිබුණි. නිවාස ආධාර ලබාදීමේ ප්‍රගතිය දුර්වල මට්ටමක පැවතීම හේතුවෙන් ප්‍රතිලාභීන් විසින් නිවාස ඉදිකිරීමද දුර්වල මට්ටමක පැවති අතර නිවාස 381 ක් අතුරින් සම්පූර්ණයෙන් වැඩ අවසන් කර තිබුණේ නිවාස 03 ක පමණක් විය. | මෙම වැඩසටහන මෙහෙයවීම සඳහා කිසිදු වගකීමක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී නොමැති අතර පහසුකම් සැපයීම හා සම්බන්ධීකරණ කටයුතු පමණක් සිදු කරමි. | අදාල සුභ සාධන වැඩසටහනට සම්බන්ධිත ආයතන සමඟ සමීප සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් අප්‍රමාදව අදාල කාර්යයන් ඉටුකර ගත යුතුය. |
| (ඇ) | විදාතා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් ගමට තාක්ෂණය ගෙනයාමේ අරමුණින් ආරම්භ කර තිබූ විදාතා වැඩසටහන යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 සඳහා 2005 වර්ෂයේදී විජලන යන්ත්‍ර , බේකරි උඳුන්, යෝගට් ඉන්කියුබේටර්, පොල්තෙල් නිස්සාරණ යන්ත්‍ර වැනි භාණ්ඩ වර්ග 09 ක් යටතේ භාණ්ඩ ඒකක 68 ක් ලබාදී තිබුණි. එකී කාලයට අදාලව | මෙකී උපකරණ නවීන තාක්ෂණයට නොගැලපෙන බැවින් බොහොමයක් උපකරණ අපහරණය කර ඇති බව හා 2021 වර්ෂයට අදාළව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කරමි. | අදාල ව්‍යාපෘතියේ අරමුණුගත කාර්යයන් සඳහා යොදා ගැනීමට කටයුතු කල යුතුය. |

(2005 සිට 2020) විදාතා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රමාණවත් සම්බන්ධීකරණයක් සිදුකර ඇති බවට හඳුනාගත නොහැකි විය. ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් පවතින විදාතා මධ්‍යස්ථානවලින් ලබාගත් තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය වනවිට එකී භාණ්ඩවලින් භාණ්ඩ ඒකක 11 ක් වෙන්දේසි කරද , භාණ්ඩ ඒකක 5 ක් වෙනත් පාර්ශව වෙත ලබාදීද, භාණ්ඩ ඒකක 4 ක් විනාශවීද, ඉතිරි භාණ්ඩ ඒකක 48 ම අභාවිතව හෝ නිෂ්කාර්යව පැවති අතර, වර්තමානය වනවිට ව්‍යාපෘතිය ක්‍රියාකාරී මට්ටමක නොවීය.

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික්කයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාල වන පරිදි තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක නිශ්චිතව හඳුනාගෙන ඒ අනුව එම අරමුණු හා ඉලක්ක සපුරා ගැනීම පිළිබඳ තොරතුරු පද්ධතියක් නොවූ අතර දිස්ත්‍රික්කය තුල සිදුකරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් ඒ ඒ තිරසර සංවර්ධන අරමුණු වලට අදාලව ඒ ඒ වර්ෂවලට අදාල තත්ත්වයන් පමණක් හඳුනාගෙන තිබීම හේතුවෙන් කාලානුරූපීව තිරසර සංවර්ධන අරමුණුවලට ලඟාවීමේ ප්‍රගතියක් හඳුනාගත නොහැකි විය. | රජයේ ප්‍රමුඛ සංවර්ධන වැඩසටහන් වන ගම්පෙරලිය, සපිරි ගමක් වැනි වැඩසටහන් හා විවිධ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු මඟින් ලබා දෙන ප්‍රතිපාදන මත විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක වන බැවින් අදාළ වන තිරසර සංවර්ධන අරමුණුවලට ළඟා වීම හඳුනා ගැනීම දුෂ්කර වී ඇත. | දිස්ත්‍රික්කයට අදාල තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් හඳුනාගත යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවක සංඛ්‍යාව 1566 දෙනෙකු වූ අතර , වැටුප් හා දීමනා වියදම රු.මිලියන 696 ක් විය. අරණායක සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුරද, තෘතීය මට්ටමේ තනතුරු පුරප්පාඩු 10 ක් ද, පැවතුණි. ද්විතීයික මට්ටමේ තනතුරු 06 ක පුරප්පාඩු 98 ක් පැවති අතර ඉන් 79 ක්ම ග්‍රාම නිලධාරීන් විය. ප්‍රාථමික මට්ටමේ තනතුරු 4 කට අදාලව පුරප්පාඩු 17 ක් විය. තෘතීයිය මට්ටම යටතේ සංවර්ධන නිලධාරි තනතුරු 109 ක් අනුමතව පැවතියද, සත්‍ය ප්‍රමාණය 525 ක් වූයෙන් නිලධාරීන් 416 ක අතිරික්තයක් විය. | පුරප්පාඩු සම්බන්ධයෙන් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය දැනුවත් කර ඇත. | පුරප්පාඩු පිරවීමට අදාල කටයුතු සිදු කල යුතුය. |